මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන විධානය 2018 අංක 08 — 2018 සැප්තැම්බර් 04

## 2013 අංක 01 දරන මුදල් සමාගම් (ව්‍යුහාත්මක වෙනස්කම්) විධානය සංශෝධනය කිරීම

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 12 වන වගන්තියට අනුව පැවරී ඇති බලතල අනුව මුදල් මණ්ඩලය විසින් 2013 ජූනි මස 07 දින ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලද 2013 අංක 01 දරන මුදල් සමාගම් (ව්‍යුහාත්මක වෙනස්කම්) විධානයෙහි විධාන අංක 3.1 ඉවත් කිරීම සඳහා පහත දැක්වෙන විධානය නිකුත් කෙරේ.

| | |
|---|---|
| 1. අදාළත්වය හා විෂය පථය | මෙම විධානය මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 08 දරන විධානය ලෙස හඳුන්වනු ලැබේ. |
| 2. ඉවත් කිරීම | 2013 ජූනි 07 දින නිකුත් කරන ලද 2013 අංක 01 දරන මුදල් සමාගම් (ව්‍යුහාත්මක වෙනස්කම්) විධානයෙහි විධාන අංක 3.1 මෙමගින් ඉවත් කෙරේ. |
| 3. ක්‍රියාත්මක කිරීම | මෙම විධානයන් නිකුත් කළ දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වේ. |

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**